# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත

---

**[සහතිකය සටහන් කළේ 1996 ඔක්තෝම්බර් මස 24 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදි.

---

1996 ඔක්තෝම්බර් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 1.65 යි.** **තැපැල් ගාස්තුව : රු. 2.55 යි.**

## 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත

[ සහතිකය සටහන් කළේ 1996 ඔක්තෝබර් මස 24 වන දින ]

එල් . ඩී .-ඕ. 37/94

**ආබාධ සහිත තැනැත්තන් උදෙසා වූ ජාතික සභාවක් පිහිටුවීම සඳහා ද ශ්‍රී ලංකාවේ සිටින ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම,අභිසංවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ආබාධ සහිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම,ඔවුන්ගේ ශුභසාධනය සහ ඔවුන්ට සහන සැලසීම අරභයා වූ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරීම සඳහා නෛතික විධිවිධාන සැලැස්වීම අවශ්‍ය වී ඇති හෙයින් ද එකී කාර්ය, උන්නතියට පත් කිරීම් වස් ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික සභාවක් පිහිටුවීම පිණිස විධිවිධාන සැලැස්වීම අවශ්‍ය වී ඇති හෙයින් :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

**1.**මේ පනත,1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර,ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ආමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

### I වන කොටස
### ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික සභාවක් පිහිටුවීම

ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික සභාවක් පිහිටුවීම

**2. (1)** "ආබාධ සහිත තැනැත්තන් උදෙසා වූ ජාතික සභාව" යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන ) සභාවක් පිහිටුවනු ලැබිය යුතුය.

**(2)** ඒ සභාව, **(1)** වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන්,අවිච්ජින්න පැවැත්මක් ඇති හා පොදු මුද්‍රාවක් තබා ගත හැකි සංස්ථාවක් වන අතර, ඒ නාමයෙන් ඒ සභාව විසින් ද ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකිය.

2- ඩී 041337 – 5,605 (96/08)

සභාවේ සංයුතිය.

**3.** සභාව,පහත සඳහන් තැනැත්තන්ගෙන්,එනම් —

(අ) සභාවේ සභාපතිවරයා විය යුතු අමාත්‍යවරයාගෙන්;

(ආ) ආබාධ සහිත තැනැත්තන් නියෝජනය කිරීම පිණිස සහ ආබාධ සහිත තැනැත්තන්ට ස්වයං ආධාර සපයන සංවිධාන ඇතුළුව, ආබාධ සහිත තැනැත්තන් සඳහා සේවා සැපයීමේ නිරතව සිටින (මෙහි මින් මතු "ස්වේච්ඡා සංවිධාන" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත කරනු නොලැබූ පුද්ගල මණ්ඩල නියෝජනය කිරීම පිණිස අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් එකොළොස් දෙනෙකුගෙන් ;

(ඇ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් හෝ පළාත් සභා මන්ත්‍රීවරයන් හෝ පළාත් පාලන ආයතනවල සභිකයන් හෝ වෘත්තික,නිලධර පුද්ගල මණ්ඩලවල සාමාජිකයන් හෝ රජයේ නිලධරයන් අතුරින් අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් නමින් හෝ ධුරයෙන් පත් කරනු ලබන සාමාජිකයන් නමදෙනකුගෙන් සමන්විත විය යුතුය.

(ආ) හෝ (ඇ) ඡේද යටතේ පත් කරනු ලබන සාමාජිකයකු, මෙහි මින් මතු "පත් කළ සාමාජිකයා"යනුවෙන් සඳහන් කරනු ලැබේ.

පත් කළ සාමාජිකයන්ගේ ධුර කාලය.

**4.** පත් කළ සෑම සාමාජිකයකු ම,ඔහුගේ මරණය,ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නිසා කලින් තම ධුරය හිස් කළහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය.

පත් කළ සාමාජිකයන් ධුරයෙන් ඉවත් කිරීම සහ ඉල්ලා අස්වීම.

**5.** (1) ජනාධිපතිවරයා විසින්, අමාත්‍යවරයා විමසා, කිසිදු හේතු දැක්වීමක් නොමැතිව,යම් පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(2) මරණය, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම හේතු කොට ගෙන යම් පත් කළ සාමාජිකයකු තම ධුරය හිස් කරන අවස්ථාවක දී, ඒ සාමාජිකයාගේ අනුප්‍රාප්තිකයා වශයෙන් වෙනත් යම් තැනැත්තකු,3 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන,අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකිය. එසේ පත් කරනු ලබන සාමාජිකයකු විසින්, තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(3) පත් කරනු ලැබූ යම් සාමාජිකයකු විසින් ජනාධිපතිවරයා වෙත ආමන්ත්‍රණය කරනු ලබන ලිපියක් මගින් කවර වේලාවක දි වුව ද තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(4) රෝගාතුරවීම, දුබලතාව හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතු කොට ගෙන මාස තුනකට නොඅඩු කාලයක් තම ධුරයේ කාර්ය ඉටු කිරීමට යම් පත් කළ සාමාජිකයෙකු තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක දි එසේ වීමට හේතු ජනාධිපතිවරයා වෙත ලියවිල්ලකින් දැනුම්දීම ඒ සාමාජිකයාගේ යුතුකම වන්නේය. එවිට, ජනාධිපතිවරයා විසින්, අමාත්‍යවරයා විමසා, 3 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඒ සාමාජිකයා වෙනුවෙන් වැඩ බැලීමට වෙනත් යම් තැනැත්තකු පත් කළ හැකිය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

6. මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික, සභාවේ සියලුම සාමාජිකයන්ට හෝ යම් සාමාජිකයකුට ගෙවනු ලැබිය හැකිය.

සභාපතිවරයා සහ රැස්වීම්වල කටයුතු කරගෙන යාම.

7. (1) සභාපතිවරයා පැමිණ සිටින සභාවේ සියලුම රැස්වීම්වල මුලසුන ඔහු විසින් දැරිය යුතුය.සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටියහොත් ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරෙන් යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරීමට තෝරා ගත යුතුය.

(2) සභාවේ යම් රැස්වීමක ගණපූරණය සඳහා අවශ්‍ය සාමාජික සංඛ්‍යාව පස්දෙනෙක් වේ.

(3) සභාව විසින් තීරණය කරනු ලබන වේලාවක දී සහ එසේ තීරණය කරනු ලබන ස්ථානයක දී අවශ්‍ය කවර වුව ද වාර

ගණනක් සභාව රැස්විය යුතු අතර,කෙසේ වුව ද, යටත් පිරිසෙයින් මාසයකට වරක් රැස්විය යුතු ය. තවද, මේ පනතේ වෙනත් විධි විධානවලට සහ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයකට යටත්ව,සභාවේ රැස්වීම් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල දී සාකච්ඡා කළ යුතු කරුණු සභාව විසින් විධිමත් කරනු ලැබිය යුතුය.

(4) මේ පනතේ 15 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ නිලධරයකු සභාවේ එදිනෙදා කටයුතු පරිපාලනය භාරව සිටීමට සභාපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

පුරප්පාඩුවක් තිබීම හේතුකොට ගෙන සභාවේ ක්‍රියා නිර්බල නොවන බව.

8. සභාවේ යම් පුරප්පාඩුවක් තිබීම හෝ සභාවේ යම් සාමාජිකයකු පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීම හෝ පමණක් හේතු කොට ගෙන සභාවේ යම් ක්‍රියාවක්, තීරණයක් හෝ කාර්ය පටිපාටියක් නිර්බල වන්නේ යයි නොසැලකිය යුතු ය.

සාමාජිකය න් වෙත බලතල

9. මේ පනතින් සභාව වෙත පවරා දී ඇති හෝ පනවා ඇති හෝ භාර කොට ඇති බලතල කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් සභාව විසින් එහි යම් සාමාජිකයකු වෙත පවරනු ලැබිය හැකි අතර, ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය පාවිච්චි කිරීමේ දී ඉටු කිරීමේ දී හෝ සිදු කිරීමේදී හෝ සිදු කිරීමේ දී සභාවේ සාමාන්‍ය හෝ විශේෂ විධ◌ානවලට ඔහු යටත් විය යුතුය.

සභාවේ ලේකම්වරයා.

10. අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා සභාවේ ලේකම්වරයා වශයෙන් කටයුතු කළ යුතුය.

සභාවේ මුද්‍රාව.

11. (1) සභාවේ මුද්‍රාව, සභාව විසින් නිශ්චය කරනු ලබන සහ සැලසුම් කරනු ලබන ආකාරයකින් විය හැකි අතර, සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකිය.

(2) සභාවේ මුද්‍රාව, සභාව විසින් කලින් නිශ්චය කරනු ලබන තැනැත්තෙකු භාරයේ තැබිය යුතය.

(3) සභාවේ අනුමතය ඇතිව සහ සභාපතිවරයා ද සභාවේ එක් සාමාජිකයකු ද ඉදිරිපිට දී මිස, සභාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබියයුතු අතර,තමා පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතුය.

(4) සභාවේ මුද්‍රාව තබනු ලබන සාධන පත්‍රවල සහ ලේඛනවල රෙජිස්ටරයක් සභාව විසින් පවත්වාගෙන යා යුතුය.

12. ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමට, අභිසංවර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට වගබලාගැනීම සභාවේ ප්‍රධාන කර්තව්‍ය වන්නේය. සභාවේ ප්‍රධාන කර්තව්‍ය.

13. 12 වන වගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව පහත දැක්වෙන කර්තව්‍ය සභාවේ අනෙකුත් කර්තව්‍ය වන්නේ ය:- සභාවේ අනෙකුත් කර්තව්‍ය.

(අ) ආබාධ සහිත තැනැත්තන්ගේ ශුභසාධනය ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ අභිසංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම;

(ආ) අදාළ අමාත්‍යාංශ, පළාත් සභා,පළාත් පාලන ආයතන,දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල,රාජ්‍ය සහ පුද්ගලික අංශ සහ සංවිධාන විමසා,ආබාධ සහිත තැනැත්තන්ගේ අර්ථ සිද්ධිය හා අයිතිවාසිකම් වැඩිදියුණු කිරීම සහ ආරක්ෂා කිරීම ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය සියලු පියවර ගැනීම;

(ඇ) ආබාධ සහිත තැනැත්තන්ගේ ශුභ සාධනය ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන් ආරක්ෂා කිරීම සඳහා වූ යෝජනා ක්‍රම නිර්දේශ කිරීම;

(ඈ) ආබාධ සහිත තැනැත්තන්ගේ ශුභ සාධනය ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ යෝජනා ක්‍රම මූලාරම්භනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඉ) ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් වූ අදාල ජාත්‍යන්තර ප්‍රකාශන සහ සම්මුති ආණ්ඩුව විසින් පිළිගනු ලබන බවට සහ අනුගමනය කරනු ලබන බවට වග බලා ගැනීම ;

(ඊ) ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් සහ එවැනි තැනැත්තන්ට ලබා ගත හැකි සේවා සම්බන්ධයෙන් නිරවද්‍ය සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම ;

(උ) ආබාධ වලට ප්‍රධාන හේතු මොනවාදැයි සොයා දැන ගැනීම සහ ඒවා වැලැක්වීමේ හා පාලනය කිරීමේ ඵලදායි පියවර ප්‍රවර්ධනය කිරීම ;

(ඌ) ආබාධ සහිත තැනැත්තන් පුනරුප්ථාපනය කිරීම සඳහා ගත යුතු පියවර සකස් කොට ඒවා ප්‍රවර්ධනය කිරීම ;

(එ) ආබාධ සහිත තැනැත්තන් සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම;

(ඒ) ආබාධ සහිත තැනැත්තන් සඳහා වඩා හොඳ ජීවන තත්ත්වයක් ඇති කිරීමට වග බලා ගැනීම;

(ඔ) ආබාධ සහිත තැනැත්තන්ගේ අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස සපුරාලන බවට වග බලා ගැනීම;

(ඕ) ආබාධ සහිත තැනැත්තන්ට නැවතීම් පහසුකම් සලසා ඔවුන් රැක බලා ගැනීම සඳහා ආයතන පිහිටුවා පවත්වාගෙන යාම සහ එවැනි තැනැත්තන්ට අධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව ලබා දීම. ;

(ක) ආබාධ සහිත තැනැත්තන්ට නැවතීම් පහසුකම් සැපයීමේ ආයතන පිහිටුවීම සහ එවැනි තැනැත්තන්ට අධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව ලබා දීමට රජය සහ පුද්ගලයන් දිරිමත් කිරීම;

(ග) ආබාධ සහිත තැනැත්තන් රැක බලා ගැනීම සඳහා පිහිටුවන ලද ආයතන වල කටයුතු සඳහා මඟ පෙන්වීම,ඒවාට සහය දීම, ඒ කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම;

(ච) සියළුම කටයුතු වලට සම්පූර්ණයෙන් සහභාගී වීමට ආබාධ සහිත තැනැත්තන් දිරිමත් කිරීම සහ ඒ සඳහා ඔවුන්ට පහසුකම් සැලසීම ;

(ජ) ආබාධ සහිත තැනැත්තන්ට පිවිසිය හැකි සේ භෞතික පරිසරය සකස් කිරීමේ වැඩ පිළිවෙලවල් හඳුන්වාදීම සහ තොරතුරු ලබාගැනීමට සහ සන්නිවේදනයට ප්‍රවේශය ආබාධ සහිත තැනැත්තන්ට ලබාගත හැකි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ;

(ට) ආබාධ සහිත තැනැත්තන්ගේ තත්ත්වය නංවාලීම සඳහා ආණ්ඩුව විසින් සහ ස්වේච්ඡා සංවිධාන සහ පුද්ගල මණ්ඩල විසින් සකස් කරන ලද, මූලාරම්භ කරන ලද සහ ක්‍රියාත්මක කරනු ලබන වැඩ පිළිවෙලවල් සහ යෝජනා ක්‍රම අධීක්ෂණය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සහ එවැනි කාර්ය සඳහා ප්‍රදාන ලබාදීම හා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඩ) ප්‍රකාශන පළ කිරීමෙන් සහ වෙනත් වැඩපිළිවෙලවල් මගින් ආබාධ සහිත තැනැත්තන්ගේ තත්වය සහ අවශ්‍යතා පිළිබඳව මහජනයා දැනුවත් කිරීම ;

(ණ) ආබාධ සහිත තැනැත්තන්ට සේවා සැපයීමේ නිරතව සිටින සංවිධාන වලට ප්‍රදාන මගින් හෝ අන්‍යාකාරයකින් සහය දීම ;

(ත) ආදායම් ලැබෙන සේවා නියුක්ති වල යෙදීමට ආබාධ සහිත තැනැත්තන්ට හැකි සෑම විටම සහය දීම ;

(ද) ආබාධ සහිත තැනැත්තන්ගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීමේ ක්‍රම පිළිබඳ අධ්‍යයන සහ පර්යේෂණ සඳහා ධෛර්ය දීම හා සියළු ක්‍රියාකාරකම් විෂයයෙහි ලා ඔවුන්ගේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම; සහ

(න) ඉහත සඳහන් කර්තව්‍ය සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ඉටු කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියළු ක්‍රියා සහ දේ කිරීම ;

සභාවේ බලතල.

**14** පහත දැක්වෙන බලතල සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය :-

(අ) චංචල හෝ නිශ්චල දේපල කිසිවක් අත්කර ගැනීම, දැරීම,බද්දට ගැනීම හෝ දීම හෝ කුලියට ගැනීම හෝ දීම,උකස් කිරීම,ඔඩපනය කිරිම හෝ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ආ) සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේදි සභාවට සහය වීම සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වු ජාතික මහ ලේකම් කාර්යාලයක් පිහිටුවීම ;

(ඇ) සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් සේවයෙහි නියුක්ත කිරීම ;

(ඈ) සභාවේ කර්තව්‍ය ඉටු කිරීම සහ බල තල ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය සියළු ගිවිසුම් වලට කෙලින්ම හෝ තත්කාර්යය සඳහා බලය පවරනු ලැබූ නිලධරයකු හෝ නියෝජිතයකු මාර්ගයෙන්, ඇතුලත් වීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම ;

(ඉ) යම් බැංකුවක හෝ බැංකු වල ජංගම ගිණුම්,ඉතිරි කිරීමේ ගිණුම් හෝ තැන්පතු ගිණුම් විවෘත කිරිම සහ පවත්වාගෙන යාම;

(ඊ) සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන මුදල් ණයට ගැනීම;

(උ) ශ්‍රී ලංකාවේ හෝ විදේශීය හෝ ප්‍රභවයන්ගෙන් චංචල හා නිශ්චල යන දෙවර්ගයේ ම ප්‍රදාන, පරිත්‍යාග සහ රික්ථවරණ පිළිගැනීම සහ භාර ගැනීම සහ සභාවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා ඒවා යෙදවීම;

(ඌ) සභාවේ කටයුතු කළමණාකරණය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ; සහ

(එ) සාමාන්‍යයෙන් සභාවේ කටයුතු නිසිපරිදි ඉටු කිරිම පහසුකරලීම සඳහා අවශ්‍ය වන වෙනත් සියළු දේ කිරීම

## II වන කොටස

## සභාවේ කාර්ය මණ්ඩලය

15. (1) සභාවේ කටයුතු නිසි පරිදි සහ කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සභාව විසින් සලකනු ලබන නිලධරයන් සහ සේවකයන් සභාව විසින් පත් කරනු ලැබිය හැකිය. සභාවේ කාර්ය මණ්ඩලය.

(2) මේ වගන්තිය යටතේ පත් කිරීම් කිසිවක් කිරීමේ දී ආබාධ සහිත තැනැත්තන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කිරීමේ යෝග්‍යතාව පිළිබඳව සභාව සැලකිල්ලට ගත යුතුය.

(3) මේ පණතේ අනෙකුත් විධිවිධාවලට යටත්ව, සභාව විසින්,-

(අ) සභාවේ යම් නිලධරයකු හෝ සේවකයකු විෂයයෙහි විනය පාලනය පවත්වා ගෙන යාම හෝ ඔහු සේවයෙන් පහ කිරීම කරනු ලැබිය හැකිය ;

(ආ) ඒ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පඩිනඩි හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නිශ්චය කරනු ලැබිය හැකිය ;

(ඇ) ඒ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සේවා නියම සහ කොන්දේසි තීරණය කරනු ලැබිය හැකිය ; තවද

(ඈ) සභවේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ ප්‍රතිලාභය සඳහා අර්ථසාධක අරමුදලක් සහ වෙනත් යම් ශුභසාධන යෝජනා ක්‍රම පිහිටුවා ඒවා විධිමත් කරනු ලැබිය හැකි අතර, එවැනි යම් අරමුදලකට හෝ යොජනා ක්‍රමයකට දායක මුදල් ගෙවිය හැකිය.

16. (1) සභාවේ ඉල්ලීම පිට රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයෙකු, ඒ නිලධරයාගේ ද ඔහු සේවය කරන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, සභාවේ කාර්ය මණ්ඩලයට, එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය. සභාවේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

(2)සභාවේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2)වන උපවගන්තියේ විධිවිධාන,අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ රජයේ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(3)සභාවේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක දී,1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන,අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ රජයේ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(4)යම් නිශ්චිත කාල පරිච්ඡේදයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග යම් ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු සභාව විසින් සේවයේ යොදවනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් සභාවට සේවය කරනු ලබන කාල පරිච්ඡේදය,එකී ගිවිසුම යටතේ ඒ තැනැත්තාගේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා,ආණ්ඩුවට කළ සේවයක් ලෙස සලකනු ලැබිය යුතුය.

## III වන කොටස

### මුදල්

සභාවේ අරමුදල.

17. (1) ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

18.

(2) පහත දැක්වෙන මුදල් ඒ අරමුදලට ගෙවනු ලැබිය යුතුය :-

(අ) සභාවේ පරිහරණය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ප්‍රමාණ;

(ආ)ආධාර,ප්‍රදාන,පරිත්‍යාග හෝ රික්ථවරණ වශයෙන්, ශ්‍රී ලංකාවේ හෝ විදේශීය හෝ කවර හෝ ප්‍රභවයකින් සභාව වෙත ලැබෙන සියලු මුදල් ප්‍රමාණ;

(ඇ)සභාවේ චංචල හෝ නිශ්චල යම් දේපළක් විකිණීමෙන් උපලබ්ධ වන මුදල් වශයෙන් සභාවට ලැබෙන සියලු මුදල් ප්‍රමාණ.

(3) පහත දැක්වෙන මුදල්,අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය -:

(අ) මේ පනත යටතේ සභාවේ බලතල,කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී,ඉටු කිරීමේ දී සහ කිරීමේ දී සභාව විසින් දරනු ලබන යම් වියදමක් පියවා ගැනීම සඳහා අවශ්‍ය සියලු මුදල් ප්‍රමාණ ;

(ආ)ආබාධ සහිත තැනැත්තන්ගේ තත්වය නගාසිටුවීම හෝ වැඩිදියුණු කිරීම උදෙසා යම් පුද්ගලයකු හෝ සංවිධානයක් හෝ විසින් කරනු ලැබූ සුවිශේෂ හෝ විශිෂ්ට දායකත්වයට උපහාර වශයෙන් යම් කරුණා සහගත ගෙවීමක් ඒ පුද්ගලයාට හෝ සංවිධානයට ගෙවීමට සභාව විසින් බලය දෙනු ලබන සියලු මුදල් ප්‍රමාණ ;

(ඇ)මේ පනතින් හෝ මේ පනත යටතේ එකී අරමුදලින් ගෙවිය යුතු වන සියලු මුදල් ප්‍රමාණ.

ගිණුම් සහ විගණනය.

**18.(1)** සභාවේ ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි පරිදි ගිණුම් තැබීමට සභාව විසින් කටයුතු සැලැස්විය යුතුය.

(2) සභාවේ මුදල් වර්ෂය,ලිත් වර්ෂය වන්නේය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සභාවේ මුදල් ආයෝජනය කිරීම.

**19.** සභාවට අයත් යම් මුදලක් සභාව විසින් නිශ්චය කරනු ලබන ආකාරයකට සභාව විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

## IV වන කොටස

## ලියාපදිංචි කිරීම

සභාව වෙත ලියාපදිංචි වීම.

**20. (1)** යම් ස්වේච්ඡා සංවිධානයක් මේ පනත යටතේ ලියාපදිංචි කර ඇත්නම් මිස, කිසිදු ස්වේච්ඡා සංවිධානයක් විසින්,ආබාධ සහිත තැනැත්තන්ට, කෙළින් ම හෝ යම් ආයතනයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් හෝ සංවිධානයක් මගින් හෝ කවර

හෝ ආකාරයකින් හෝ අන්දමකින් සේවා හෝ සහාය සැපයීමෙහි ලා නොයෙදිය යුතු ය.

(2) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී යම් ස්වේච්ඡා සංවිධානයක් එවැනි සේවා හෝ සහාය සැපයීමේ නිරතව සිටියේ නම්, 1 වන උප වගන්තියේ විධි විධාන නොතකා, නියමිත දිනයේ සිට මාස තුනක් තුළ දී ඒ සංවිධානය ලියාපදිංචි කල යුතුය.

ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම

21. මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන සෑම ඉල්ලීමක් ම, නියමිත ආකෘතියේ අනුසාරයෙන් සහ නියමිත ආකාරයට සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

සහතික ප්‍රදානය කිරීම.

22. 21 වන වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක් ලැබුණු විට, සභාව විසින් ඒ ස්වේච්ඡා සංවිධානය විසින් සපයනු ලැබූ සේවා සහ ආධාර සැලකිල්ලට ගෙන, ඒ සංවිධානය ලියාපදිංචි කොට ඒ බවට සහතිකයක් ඒ සංවිධානය වෙත නිකුත් කළ යුතු ය.

## V වන කොටස

### ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

ආබාධ සහිත තැනැත්තන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අභිසංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම.

23. (1) ආබාධ සහිත කිසිදු තැනැත්තකු,යම් සේවා නියුක්තියක හෝ කාර්යාලයක හෝ සේවයට බඳවා ගැනීමේ දී හෝ යම් අධ්‍යාපනික ආයතනයකට ඇතුළු කර ගැනීමේ දී, ඒ ආබාධය හේතුකොට ගෙන ඔහු යම් වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොකළ යුතුය.

(2) යම් ගාස්තුවක් ගෙවීමෙන් හෝ නොමිලයේ හෝ සමාජයේ වෙනත් කවර වුවද සාමාජිකයකුට ප්‍රවිෂ්ට වීමට හැකි හෝ පරිහරණය කිරීමට හිමිකම ඇති යම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට ප්‍රවිශ්ටවීම හෝ එය පරිහරණය කිරීම සම්බන්ධයෙන්,ආබාධ සහිත යම් තැනැත්තකු,ඒ ආබාධය හේතුකොට ගෙන යම් බැඳීමකට, සීමා කිරීමකට හෝ කොන්දේසියකට යටත් නොකළ යුතු ය.

**24.** (1) 23 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් සිදුකොට ඇති අවස්ථාවක දී, ඒ උල්ලංඝනය කිරීම බලපානු ලැබූ තැනැත්තා පදිංචි සිටින ප්‍රදේශය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය වෙත, සහනය හෝ ප්‍රතිකර්ම පතා ඉල්ලීමක්, එසේ බලපානු ලැබූ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තා වෙනුවෙන් සභාව විසින් හෝ ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. 23 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ප්‍රතිකර්ම.

(2) එවැනි සෑම ඉල්ලීමක් ම මහාධිකරණය වෙත ආමන්ත්‍රණය කරනු ලබන ලිඛිත පෙත්සමක මාර්ගයෙන් විය යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සාදන ලද රීතිවල දක්වා ඇති කාර්ය පටිපාටියට අනුකූලව අසා තීරණය කරනු ලැබිය යුතුය.

(3) (1) වන ඡේදයේ සඳහන් යම් ඉල්ලීමක් සම්බන්ධයෙන්,අවස්ථාගත කරුණු අනුව සාධාරණ හා සාධාරණීය යයි මහාධිකරණය විසින් සලකනු ලබන සහන ප්‍රදානය කිරීමේ හෝ විධාන නිකුත් කිරීමේ බලය, මහාධිකරණයට ඇත්තේය.

## VI වන කොටස

## විවිධ කරුණු

**25.** (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් නියම කොට හෝ බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර,එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයේ සඳහන් කරනු ලබන යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම, එහි අනනුමතයේ දින සිට,එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, පරිච්ජින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය,ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

රීති සෑදීමට සභාව සතු බලය.

26. (1) සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම,ඉටු කිරීම සහ කිරීම කෙරෙහි බලපාන හෝ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික යම් කාරණාවකට අදාළව අවශ්‍ය වන්නේ යයි සභාව විසින් සලකනු ලබන රීති සභාව විසින් සාදනු ලැබිය හැකි ය.

(2)සභාව විසින් සාදනු ලැබූ සෑම රීතියක් ම අමාත්‍යවරයා විසින් අනුමත කළ යුතු අතර, ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

සභාවේ නිලධර යන් සහ සේවකයන්,දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

27.සභාවේ සියලුම නිලධරයන් සහ සේවකයන්,දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා, රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

28.සභාව, අල්ලස් පනතේ අර්ථානුකූලව, උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර,ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

සභාවේ විධානය මත,පනත යටතේ කරනු ලැබූ ක්‍රියා සම්බන්ධයෙන් සභාවේ සාමාජිකයන්ට සහ නිලධරයන්ට ආරක්ෂාව සැලසීම.

29. (1) සභාව විසින් සභාවේ යම් සාමාජිකයකු,නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත සද්භාවයෙන් කරනු ලැබූ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් සභාවට හෝ ඒ සාමාජිකයාට හෝ නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) සභාව විසින් හෝ සභාවට විරුද්ධ හෝ යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී සභාව විසින් දරන ලද වියදම් කිසිවක් සභාව විසින් ගෙවිය යුතු අතර, යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සභාවට ගෙවනු ලැබූ හෝ සභාව විසින් අය කර ගනු ලැබූ යම් ගාස්තුවක් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

(3) (1) වන උප වගන්තියේ සඳහන් එවැනි යම් තැනැත්තෙකු විසින් මේ පණත යටතේ හෝ සභාවේ විධානය මත හෝ කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඒ ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙනි යයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ නඩුවේ දී ඔහු විසින් දරන වියදම් කිසිවක් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අය කර ගනු ලැබී නම් මිස, ඒ වියදම් සභාව විසින් ගෙවිය යුතුය.

සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලික හෝ ඔහුගේ දේපළට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**30.** සභාවට විරුද්ධව පවරන ලද යම් නඩුවක දී, සභාවේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් කළ නොහැකි විය යුතුය.

වාර වාර්තා.

**31.** මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා, සභාව විසින් නිශ්චය කරනු ලබන කාරණා සම්බන්ධයෙන්, සභාය විසින් නිශචය කරනු ලබන ආකෘතියට අනුව, සභාව වෙත වාර වාර්තා සහ තොරතුරු සපයන ලෙස යම් තැනැත්තෙකුට සභාව විසින් නියම කරනු ලැබිය හැකිය.

යම් පරිශ්‍රයකට ඇතුළුවීමට සහ පරීක්ෂා කිරීමට යම් නිලධරයකු වෙත බලය පැවරීමට සභාව සතු බලතල.

**32.** සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි සභාව විසින් සලකනු ලබන අවස්ථාවකදී ආබාධ සහිත තැනැත්තන්ට සේවා හෝ ආධාර සැපයීමේ නිරතව සිටින ස්වේච්ඡා සංවිධානයක යම් පරිශ්‍රයකට දිවා කාලයේ යුක්ති සහගත සියලු වේලාවල දී ඇතුළු වී එය පරීක්ෂා කිරීම සඳහා යම් නිලධරයකු වෙත සභාව විසින් ලිඛිතව බලය දෙනු ලැබිය හැකිය. එසේ බලය දෙනු ලැබූ නිලධරයකු මෙහි මින් මතු “බලයලත් නිලධරයා “ යනුවෙන් සඳහන් කරනු ලැබේ.

පරීක්ෂා කිරීමේ සහ සෝදිසි කිරීමේ බලතල.

**33.** යම් බලයලත් නිලධරයකු විසින්,--

(අ)ආබාධ සහිත තැනැත්තන්ට සේවා හෝ ආධාර සැපයීමේ නිරතව සිටින යම් ස්වේච්ඡා සංවිධානයක පරිශ්‍රයට ඇතුළු වී එය පරීක්ෂා කළ හැකිය :

(ආ)මේ පනත යටතේ ලියාපදිංචි නොවී ආබාධ සහිත තැනැත්තන්ට සේවා හෝ ආධාර සැපයීමේ ලා යම් ස්වේච්ඡා සංවිධානයක් නිරතව සිටී යයි විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති විටක එවැනි ස්ථානයකට ඇතුළු වී ඒ ස්ථානය පරීක්ෂා කළ හැකිය ;

(ඇ)එවැනි සංවිධානයක් මේ පනත යටතේ පවත්වා ගෙන යන පොත්පත්, රෙජිස්ටර් හෝ වාර්තා කිසිවක් පරීක්ෂා කොට ඒවායේ උධෘත හෝ පිටපත් ගනු ලැබිය හැකිය ;

(ඈ)මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලබන්නේ දැයි නිසැකව දැන ගැනීම සඳහා එවැනි යම් පරිශ්‍රයක සිටින යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කළ හැකිය.

වැරදි.

**34.** යම් තැනැත්තකු, ——

(අ)මේ පනත යටතේ ඔහු වෙත පනවා ඇති යම් නියමයකට අනුකූලව යම් වාර වාර්තාවක් හෝ තොරතුරක් සැපයීම පැහැර හැරියහොත් ;

(ආ)ඔහු විසින් සපයනු ලබන යම් වාර වාර්තාවක හෝ තොරතුරක දැන දැනම යම් සාවද්‍ය ප්‍රකාශයක් කරත හොත් ;

(ඇ)ඔහු විසින් සපයනු ලබන යම් වාර වාර්තාවක හෝ තොරතුරක යම් කාරණයක් හිතාමතාම අත් හැරිය හොත් ;

(ඈ)මේ පනතේ 33 වන වගන්තිය මගින් හෝ ඒ යටතේ යම් බලයලත් නිලධරයකුට පවරා දෙනු ලැබූ බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමේ දී ඒ නිලධරයාට ප්‍රතිරෝධය පානු ලැබුවහොත් හෝ බාධා කරනු ලැබුවහොත් ;

(ඉ) මේ පනතේ, විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් හෝ රීතියක් කඩ කළහොත්,

ඒ තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර,මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් වන්නේ ය.

35.මේ පනත යටතේ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සි කරන ලද අවස්ථාවක දී, —— පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වන අවස්ථාවක, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයෙක්ම, ලේකම්වරයෙක්ම සහ නිලධරයෙක්ම ඒ වරදට වරදකරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් වන අවස්ථාවක,ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකුම ඒ වරදට වරදකරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය;

එසේ වුව ද, ඒ වරද සිදු කරන ලද්දේ තම දැනුම නොමැතිව බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම පිණිස තමා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඒ තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඔහු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

36. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර ය අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බ පැවැත්විය යුතුය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

37. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි, —— අර්ථ නිරූපණය.

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහ නගර සභාවක්,නගර සභාවක් සහ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන,ඉටු කරනු ලබන සහ කරනු ලබන බලතලවලට, කාර්යවලට

සහ කර්තව්‍යවලට අනුරූපී හෝ සමාන බලතල,කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට,ඉටු කිරීමට සහ කිරීමට යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ ඇති කරන ලද හෝ පිහිටුවන ලද යම් අධිකාරියක් ඊට ඇතුළත් වේ ;

''ආබාධ සහිත තැනැත්තා''යන්නෙන්, සහජයෙන් ම ඇති වූ හෝ එසේ නොවූ ශාරීරික හෝ මානසික හැකියාවන්හි යම් ඌනතාවක ප්‍රතිඵලයක් වශයෙන් ජීවිතයේ අවශ්‍යතාවන් මුළුමනින් ම හෝ කොටස් වශයෙන් හෝ තමා විසින් ම තමා සඳහා ම ඉටු කර ගැනීමට නොහැකි යම් තැනැත්තකු අදහස් වේ ;

''නියමිත'' යන්නෙන්,මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කර ඇති බව අදහස් වේ ;

''පළාත් සභාව''යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ.

**පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි.**
**අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම**
**දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.**